ගිනි කුරුල්ලා



රුසියන් බසින් පරිවර්තනය

එච්. ජයරත්න

ගිනි කුරුල්ලා

රුසියන් භාෂාවෙන් පරිවර්තනය

එච්. ජයරත්න

Художники:
Виталий Иваров,
Елена Ашмазова

සමීර ප්‍රකාශන

අංක 12, පොල්දූව, බත්තරමුල්ල.

ගිනි කුරුල්ලා

© රුසියන් බසින් සිංහලයට පරිවර්තනය	එච්. ජයරත්න
පළමු මුද්‍රණය දෙවන මුද්‍රණය	2014 2024
ISBN	978 - 955 - 0983 - 53 - 7
චිත්‍ර	විතාලි ස්වාරෆ් සහ එලේනා අල්මාසවා
පරිගණක පිටු සැකැස්ම හා අකුරුකරණය	විදුර ප්‍රකාශන, අංක 58, පළමු මහල, සුපිරි වෙළඳ සංකීර්ණය, බොරැල්ල, කොළඹ 08. ☎ 0112 667910
මුද්‍රණය	එස් ඇන්ඩ් එස් මුද්‍රණ ජයන්ත වීරසේකර මාවත, කොළඹ 10. ☎ 0112 431738
ප්‍රකාශනය	සමීර ප්‍රකාශන 12, පොල්දූව, බත්තරමුල්ල. ☎ 011 2868249

ගිනි කුරුල්ලා

එකෝමත් එක රටක, කොහේදෝ රාජධානියක විස්ලාව් කියල රජ කෙනෙක් හිටියා. එයාට පුත්තු තුන් දෙනයි. දිමිත්රි කුමාරයයි, වසීලි කුමාරයයි, ඉවාන් කුමාරයයි.

එයාගෙ උයන විතර ලස්සන වටිනා උයනක් වෙන කිසිම රාජධානියක තිබුණේ නෑ. ඒ උයනෙ තිබුණා රත්තරන් ගෙඩි හැදෙන ඇපල් ගහක්. රජ්ජුරුවෝ ඔක්කෝටම වඩා ඒ ගහට ආදරය කළා. ගිනි කුරුල්ලා රෑට රෑට ඇවිත් ඒ ගහේ ඇපල් ගෙඩි කාල දැම්මා. රජ්ජුරුවන්ට බොහොම දුකයි. ඔහු පුත්තුන්ට කතා කළා.

''මගේ දරුවනේ කාටද පුළුවන් ගිනි කුරුල්ලා අල්ලන්න? උෆ පණ පිටින් අල්ල ගත්ත කෙනෙකුට මං ජීවතුන් අතර ඉන්න කම් රටෙන් බාගයක් දෙනව. මැරුණම මුළු රටම අයිති වෙයි.''

''දුක් වෙන්න එපා තාත්තෙ. අපි උයන මුර කරල ගිනිකුරුල්ල අල්ල ගන්නම්.'' රජ කුමාරයො කීවා.

පළමු දවසෙ රෑ දිමිත්රි කුමාරයා උයනට ගියා. ගිහින් අර ඇපල් ගහ යට නිදා ගත්තා. එයාට නින්ද ගියා. ඒ හින්ද ගිනිකුරුල්ලා පියාඹලා එනව ඇහුණේ නෑ. පහුවදා උදේ රජ්ජුරුවෝ දිමිත්රි කුමාරයාගෙත් අහනව.

''ඉතින් මගේ පුතේ. ගිනි කුරුල්ලා දැක්කද?

''නෑ තාත්තෙ, උෆ ආවෙ නෑ.''

ඊළඟ දවසෙ රෑ වසීලි කුමාරයා උයනට ගියා. එයත් ඒ ඇපල් ගහ යට නිදා ගත්තා. එයාට කොච්චර තදින් නින්ද ගියාද කියනව නම් ගිනි කුරුල්ලා ඇවිල්ලා ඇපල් කඩා කනව ඇහුණේ නෑ.

තුන්වෙනි දවසෙ රෑ ඉවාන් කුමාරයා උයනට ගිහින් ඒ ඇපල් ගහ යට වාඩි වුණා. පැයක්. දෙකක්, තුනක් විතර ගත වුණා. එකපාරටම උයන ආලෝකවත් වුණා. ගිනි කුරුල්ලා පියාඹා ඇවිත් ඇපල් ගෙඩිවලට කොටන්න පටන් ගත්තා.

ඉවාන් කුමාරයා හොරෙන්ම උෆට ළං වෙලා පෙඳෙන් අල්ලා ගත්තා. ඒත් ගිනි කුරුල්ලා පෙඳේ අත අරවගෙන ඉගිලිලා ගියා. එක පිහාටුවක් විතරක් ඉවාන් කුමාරයාගෙ අතේ ඉතිරි වුණා.

පහුවදා උදේ ඉවාන් කුමාරයා පිහාටුව විස්ලාව් රජ්ජුරුවන් අතට දුන්නා. ඒක ගින්දර වගේ බැබළුණා. සන්තෝසයට පත් රජ්ජුරුවො ඒක බොහොම අගය කළා. ඊට පස්සෙ ගිනි කුරුල්ලා උයනට ආවෙ නෑ.

රජ්ජුරුවෝ නැවතත් පුත්තුන්ට කතා කළා.

''දරුවනේ, ගිහින් ගිනි කුරුල්ලාව අල්ලා ගෙන එන්න.''

දිමිත්රි කුමාරයයි. වසිලි කුමාරයයි ගිනිකුරුල්ලගෙ පිහාටුවක් ගලවා ගත්ත ඉවාන් කුමාරයාට වෛර කරන්න පටන් ගත්තා. ඒ හින්ද ඒ දෙන්න වෙනම ගිනි කුරුල්ලා හොයන්න ගියා. ඉවාන් කුමාරයා තනිවම ගිනි කුරුල්ලා හොයා ගෙන ගියා.

මේ කතාන්දරය ඉක්මනින් කියා ගෙන ගියාට ඉක්මනින් ඉවර වෙන්නෙ එහෙම නෑ. ඉතිං ඉවාන් කුමාරයා අස්සයා පිටේ යනව යනවා ඉවරයක් නෑ. අන්තිමේදී ඉවාන් කුමාරයා පිට්ටනියකට ආවා. එතන තිබුණා දැන්වීම් පුවරුවක මෙහෙම ලියල තිබුණා.

''කෙලින්ම ගියොත් බඩ ගින්නෙ ඉන්න වෙනව. හීතලෙන් මිරිකෙන්න වෙනව. දකුණට ගියොත් ජීවිතේ රැක ගන්න පුළුවන්. හැබැයි අශ්වයා මැරෙනව. වමට ගියොත් මැරෙන්න වෙනවා. හැබැයි අශ්වයා නම් බේරෙනව.''



ඉවාන් කුමාරයා දැන්වීම කියවලා දකුණට ගියා.''

''අශ්වයා මැරුණත් මට බේරෙන්න පුළුවන්නෙ.'' එයා හිතුවා. ඉතින් දවස් දෙක තුනක්ම නොනැවතී ගමන් කළා. එක පාරටම අළුපාට වෘකයෙක් ඉස්සරහට ඇවිත් මෙහෙම කීවා.

''ඇයි උඹ මෙහාට ආවෙ ඉවාන්? උඹ කියෙව්වා නේද දැන්වීම් පුවරුවෙ ලියල තිබුණෙ මොකක්ද කියල''

එහෙම කියූ වෘකයා අශ්වයා කෑලිවලට ඉරල දමල යන්න ගියා.

රාජ කුමාරයා ඇඬුවා. අඬලා ඉවර වෙලා පයින් ඇවිදගෙන ගියා. මුළු දවසක්ම ඇවිද ගෙන ගිය ඔහු කවදාවත් නැති තරම් වෙහෙසට පත් වුණා. වාඩිවෙලා විවේක ගන්න ඕනෑයි කියල හිතන කොටම අළුපාට වෘකයා දුවගෙන ආවා.

''මට උඹ ගැන දුකයි ඉවාන් කුමාරයො. පයින් යන්න උඹට අමාරුයි නේද? මගේ පිට උඩට නැගපන්. කොහාටද මොකටද යන්නෙ කියල කියාපන්.''

කුමාරයා වෘකයාට කීවා තමන්ට යන්න ඕනෑ තැන කොහේද කියලා. අළුපාට වෘකයා අශ්වයා වගේම කට පියාගෙන හිටියා. රෑ වෙනකොට ඉවාන් රාජකුමාරයා ගල් තාප්පයක් ළඟට එක්කන් ගියා.

''ඉවාන් කුමාරයො, මේ තාප්පයෙන් එහා පැත්තට පැනපන්. මේකෙන් එහා පැත්තෙ උයනක් තියනව. ඒ උයනෙ ගිනි කුරුල්ලා රත්තරන් කූඩුවක් ඇතුළෙ ඉන්නව. කුරුල්ලා අල්ලා ගනින්. හැබැයි කූඩුවට අත තියන්න එපා. කූඩුවට අත තිබ්බොත් එහෙම ඒ මොහොතෙම උඹත් අල්ලා ගනීවි.''

ඉවාන් කුමාරයා තාප්පෙට උඩින් උයනට පැන්නා. ඒ උයනෙ තිබුණා රත්තරන් කුරුලු කූඩුවක්. ඒ කූඩුව ඇතුළෙ ගිනි කුරුල්ලා හිටියා. ගිනි කුරුල්ලත් අරන් ඉවාන් කුමාරයා ආපහු එන්න හැරුණා. ටික වේලාවකට පස්සෙ එයාට මෙහෙම හිතුණා.

''කූඩුවක් නැතිව මං මූ කොහෙද තියන්නෙ?'' එහෙම හිතලා ආපහු ගිහින් කූඩුව ඇල්ලුව විතරයි මුළු උයනම හෙල්ලුම් කවමින් මහා ශබ්දයක් පිටවුණා. මුරකාරයින්ට ඇහැරුණා. මුරකාරයො දුවගෙන ඇවිත් ඉවාන් කුමාරයා අල්ලගෙන ඒ රටේ රජ්ජුරුවො ළඟට අරන් ගියා. ඒ රජ්ජුරුවන්ගෙ නම දැල්මාත්.



දැඩි කෝපයට පත් දල්මාත් රජ්ජුරුවො මහ හඬින් කෑ ගැහුවා.

''උඹට ලැජ්ජ නැද්ද හොරකම් කරන්න. උඹ කව්ද? උඹේ තාත්තා කව්ද?''

''මං ඉවාන් කුමාරයා. විස්ලාව් රජ්ජුරුවන්ගෙ පුතා. ඔබේ ගිනි කුරුල්ලා අපේ උයනට ඇවිත් තාත්තා කැමතිම ඇපල් ගහේ රත්තරන් ඇපල් ගෙඩි කඩාගෙන කනව. ඉතිං තාත්තා මට කීවා ගිනි කුරුල්ලා අල්ල ගෙන එන්න කියල.''

''ඉතිං ඉවාන් කුමාරයාණනි. මට ඇවිත් කීවා නම් මං ගිනි කුරුල්ලා දෙනවනෙ. දැන් ඉතිං මං මුළු රටටම කියනව ඔබ මේ කොරපු කැත වැඩේ ගැන. හැබැයි මට එක වැඩක් කොරල දෙනව නම් ඔබ නිදහස් කරල ගිනි කුරුල්ලත් තෑගි කරනව. තුන්නවවෙනි රට පහුකරල තුන්දහවෙනි රාජ්ජෙට ගිහින් ඒ රටේ අෆ්රොන් රජ්ජුරුවන්ගේ රන්කේසර අශ්වයා මට ගෙනත් දෙන්න. ඒ වැඩේ කරන්න බැරි වුණොත් එහෙම මං මුළු රටේම ප්‍රසිද්ධ කරනව ඔබ හොරෙක් කියල.''

ඉවාන් කුමාරයා බොහොම හිතේ අමාරුවෙන් අළුපාට වෘකයා ළඟට ඇවිල්ලා විස්තරේ කීවා.

''ඉතිං ඇයි ඉවාන් කුමාරයො මං කියපු දේ අහන්නෙ නැතුව කූඩුව ඇල්ලුවෙ? හොඳයි. කමක් නෑ. මං ඔබ කියන තැනකට අරන් යන්නම්''

ඉවාන් කුමාරයා වෘකයගෙ පිට උඩ වාඩි වුණා. වෘකයා ඊතලයක් වගේ දුවගෙන ගිහින් රෑ වෙන කොට අෆ්රොන් රජ්ජුරුවන්ගෙ අශ්ව ඉස්තාලයට ආවා.

''මුර කාරයින්ට හොඳටම නින්ද ගිහිල්ලා. ඉස්තාලයට ගිහින් රන් කේසර අස්සයා අරන් එන්න. හැබැයි රත්තරන් කටකලියාවට එහෙම අත තියන්න එපා. එහෙම වුණොත් වැඩ වරදියි'' වෘකයා කීවා.

ඉවාන් කුමාරයා ඉස්තාලයට ඇතුළු වෙලා අශ්වයත් අරන් ආපහු එන කොට බිත්තියේ එල්ලා තිබුණු රත්තරන් කටකලියාවක් දැක්කා. ඉවසීමක් නැතිව ගිය ඉවාන් කුමාරයා කටකලියාව බිත්තියෙන් ගලවා ගත්තා. එතකොටම මහා ගෝෂාවක් ඉස්තාලය පුරා පැතිර ගියා. මොකද ඒ කටකලියාවට ඝාන්ධාරවල ලනු ගැට ගහල තිබුණ හින්දා.

මුරකාරයින්ට ඇහැරුණා. එහෙ මෙහෙ දිව ගිය මුරකාරයො ඉවාන් කුමාරයා අල්ල ගෙන අෆ්රොන් රජ්ජුරුවො ළඟට අරන් ගියා.

අෆ්රොන් රජ්ජුරුවො ප්‍රශ්න අහන්න පටන් ගත්තා.

''කියාපන් මොකක්ද උඹේ නම? කව්ද උඹේ තාත්තා.?''

''මම විස්ලාව් රජ්ජුරුවන්ගෙ පුතා. මගේ නම ඉවාන් කුමාරයා.''

''අනේ ඉවාන් කුමාරයො ඔබ මා ළඟට ආවා නම් මං රන්කේසර අස්සයා දෙනවනෙ. දැන් ඉතිං මං අණ බෙර ගහලා මුළු රටටම කියනවා ඔබ කරපු කැත වැඩේ ගැන. හැබැයි මට එක වැඩක් කරල දෙනව නම් මං ඔබේ වරදට සමාව දීලා රන් කේසර අස්සයයි, රන් කටකලියාවයි දෙනව. මෙහේ ඉඳල රටවල් තුන්නවයක් පහු කරල තුන්දහවෙනි රාජ්ජෙට ගිහින් සුන්දර එලේනා කුමාරිකාව අරන් එන්න.''

ඉවාන් කුමාරයා අළුපාට වෘකයා ළඟට ඇවිත් ඔක්කොම විස්තරේ කීවා.

''අපොයි, ඉවාන් කුමාරයො'' අළුපාට වෘකයා කීවා.

''ඇයි මං කීව දේ අහන්නෙ නැතුව රන් කටකලියාව ගත්තෙ? කමක් නෑ. කියන තැනකට ඔබ අරන් යන්නම්.''

ඉවාන් කුමාරයා වෘකයගෙ පිට උඩ වාඩි වුණා. වෘකයා ඊතලයක් වගේ දුවගෙන සුන්දර එලේනා කුමාරිකාවගේ රටට ගිහින් ලස්සන උයනක් වටේට තිබුණු රන් වැටක් ළඟ නැවතුණා.

''ඉවාන් කුමාරයො, දැන් ඉතිං බිමට බැහැල අර එළිමහන් පිට්ටනියට ගිහින් මං එනකල් ඉන්න.'' වෘකයා කීවා.

ඉවාන් කුමාරයා පිට්ටනියට ගියා. වෘකයා සුන්දර එලේනා කුමාරිකාව එනතුරු වැට ළඟ වාඩිවෙලා හිටියා. හවස් වෙන කොට සුන්දර එලේනා කුමාරිකාව යෙහෙළියොයි ආයම්මයි එක්ක උයනට ආවා ඇවිදින්න. කුමාරිකාව වෘකයා සිටි තැනට එනකොටම වෘකයා වැටට උඩින් පැනල කුමාරිකාව අල්ල ගෙන පුළුවන් හයියෙන් ඉවාන් කුමාරයා ළඟට දුවලා ගියා.

''ඉවාන් කුමාරයො, ඉක්මනින් මගේ පිට උඩට නගින්න.'' වෘකයා කීවා.

වෘකයා කුමාරයයි. කුමාරියයි දෙන්නම පිට උඩ තියා ගෙන අෆ්රොන් රජ්ජුරුවන්ගෙ රටට දුවල ගියා. මුර බටයො ඌව අල්ලගන්න පස්සෙන් එළව ගෙන ආවත් අල්ලගන්න බැරිවුණා.

ඉවාන් කුමාරයා සුන්දර එලේනා රාජකුමාරිකාවට ආදරේ කළා. ඇයත් ඔහුට ආදරේ කළා. කුමාරිකාව අන්‌රොන් රජ්ජුරුවන්ට භාර දෙන්න සිදුවන නිසා ඉවාන් කුමාරයා දුකින් පසු වුණා.

''මොකද ඉවාන් කුමාරයෝ, නිකං දාහට ඇරන් පන්සීයට දුන්න වගේ ඉන්නෙ?'' වෘකයා ඇහුවා.

''හරි වැඩේනෙ මගේ යාළුවේ, මං සුන්දර එලේනා කුමාරිකාවට ආදරෙයි. ඒත් ඉතින් එයා අෆ්රොන් රජ්ජුරුවන්ට භාර දෙන්න වෙනවනෙ.''

''මං ඔබට හුඟාක් උදව් කළා. ඉවාන් කුමාරයො. ඉතින් මේ උදව්වත් කරන්නම්. මං සුන්දර එලේනා රාජකුමාරිකාව විදිහට වෙස් මාරු කර ගන්නම්. ඊට පස්සෙ ඔබ මාව රජ්ජුරුවො ළඟට එක්ක ගෙන ගිහින් රන් කේසර අස්සයා ඉල්ලා ගන්න. ඔබ හුඟාක් දුර ගියාට පස්සෙ මං ඇවිදින්න යන්න රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්ලනව. එතකොට එයා ආයම්මලායි, පිරිවරයි එක්ක මාව උයනට පිටත් කරයි. අන්න ඒ වෙලාවට ඔබ මාව මතක් කරන්න. මං ආයෙත් ඔබ ළඟට එනව.''

එහෙම කියල වෘකයා පොළවට අතින් ගැහුවා. එතකොටම ඌ සුන්දර එලේනා රාජ කුමාරිකාව බවට පත් වුණා. ඉවාන් ඌ අෆ්රොන් රජ්ජුරුවො ළඟට එක්කන් ගියා. මේ තරම් වටිනා වස්තුවක් ලැබුණු එක ගැන සතුටු වුණු රජ්ජුරුවෝ ඉවාන් කුමාරයාට රන්කේසර අශ්වයා තෑගි කළා. ඉවාන් කුමාරයා සුන්දර එලේනාවත් අශ්වයා පිට උඩ වාඩිකරවා ගෙන දුල්මාත් රජ්ජුරුවන්ගේ රටට ගියා.

අළුපාට අශ්වයා දින දෙක තුනක් අෆ්රොන් රජ්ජුරුවො ළඟ ඉඳලා හතර වෙනි දවසෙ ඇවිදින්න යන්න අවසර ඉල්ලුවා.

ඉවාන් කුමාරයා සුන්දර එලේනාත් එක්ක කතා කර කර අශ්වයා පිටේ ගමන් කළ හින්ද වෘකයා ගැන අමතක වුණා. ප්‍රමාද වෙලා තමයි මතක් වුණේ.

''අපොයි, කොහේද දන්නෙ නෑ මගේ අළුපාට වෘකයා?''

මෙන්න එක පාරටම කොහේ ඉඳලාද දන්නෙ නෑ වෘකයා ඔවුන් ඉදිරියේ පෙනී හිටියා.

''ඉවාන් කුමාරයො මගේ පිට උඩට නගින්න. සුන්දර කුමාරිකාව රන් කේසර අස්සයා පිටේ එයි. වෘකයා කීවා.

හුඟ දවසක් ගමන් කළාද, ටික දවසක් ගමන් කළාද දන්නෙ නෑ. ඔවුහු දුල්මාත් රජ්ජුරුවන්ගේ රටට පැමිණියා. එතකොට ඉවාන් කුමාරයා වෘකයාට කන්නල්ව් කළ.ා

''මගේ වෘක යාළුවෝ, උඹ මට හුඟාක් උදව් කළා. මේ අන්තිම උදව්වත් කරන්න. උඹට බැරිද රන්කේසර අස්සය වෙන්න? මට ඒ අස්සයගෙන් වෙන් වෙන්න බෑ.''

පොලවට පයින් පාරක් ගහපු වෘකයා රන්කේසර අශ්වයා බවට පත් වුණා.

ඉවාන් කුමාරයා සුන්දර කුමාරිකාව පිට්ටනියක නවත්තලා වෘකයා පිටේ නැගල දල්මාත් රජ්ජුරුවො ළඟට ගියා.

ඉවාන් කුමාරයා රන්කේසර අශ්වයා පිටේ නැගලා එනවා දැකලා දල්මාත් රජ්ජුරුවො බොහොම සතුටු වුණා ඔහු ඉවාන් කුමාරයාට රත්තරන් කූඩුවක් එක්කම ගිනි කුරුල්ලා දුන්නා.

ඉවාන් කුමාරයා මාලිගාවෙන් පිටවෙලා ඇවිත් රන්කේසර අශ්වයා පිටේ නැගලා සුන්දර කුමාරිකාවත් සමග ගෙදර එන්න පිටත් වුණා. ඒ කිව්වෙ විස්ලාව් රජ්ජුරුවන්ගෙ රාජධානියට.

ඊළඟ දවසෙ දල්මාත් රජ්ජුරුවො රන්කේසර අශ්වයා පිටේ ඇවිදින්න යන්න හිතුවා. අශ්වයාට සැදලය දමන්න අණ කරල රජ්ජුරුවො උෆ පිට නැගලා පිට්ටනියකට ආවා. අශ්වයා පිට උඩ සිටි රජ්ජුරුවො බිමට දමල නැවතත් වෘකයා බවට පත් වෙලා ඉවාන් කුමාරයා ළඟට ආවා.

''ඉවාන් කුමාරයා'' වෘකයා කීවා. ''මගේ පිටට නගින්න. සුන්දර එලේනා රන්කේසර අස්සයා පිටේ එයි.''

වෘකයා ඉවාන් කුමාරයාගෙ අශ්වයා මරලා දාපු තැනට ඇවිත් කතා කළා.

''ඉතින් ඉවාන් කුමාරයො, මං ඔබට අවංකව සත්‍යවාදීව සේවය කළා. මං ඔබේ අශ්වයා මරල දැම්මෙ මෙතනදි. මං එතෙන්ට ආයෙත් ඔබව එක්කන් ආවා. දැන් ඔබට අස්සයෙක් ඉන්නව. මගේ පිටෙන් බැහැලා ඒ අස්සයා පිටට නැගලා ඔබ කැමති තැනකට යන්න.

තවදුරටත් මං ඔබේ සේවකයෙක් නෙවෙයි.''

එහෙම කියල වෘකයා යන්න ගියා. ඉවාන් කුමාරයා ඇළුපාට වෘකයා ගැන දුක්වෙමින් සුන්දර රාජකුමාරිකාවත් සමග සියරට බලා පිටත් වුණා.

කොච්චර වෙලාවක් අසු පිටේ ගියාද කියල දන්නෙ නෑ. අන්තිමේදී විවේක ගන්න හිතාගෙන බොහොම මෘදු තණ බිස්සක් උඩ වැතිරුණා. මහන්සිය හින්ද හොඳින් නින්ද ගියා.

මේ අතර ඉවාන් කුමාරයාගෙ අය්යල දෙන්න. ඒ කිව්වෙ දිමිත්රියි, වසීලියි හිස් අතින් ආපසු එමින් සිටියා. ඔවුන්ට තමන්ගෙ සහෝදරයයි. සුන්දර රාජ කුමාරිකාවයි. රන්කේසර අශ්වයි. රත්තරන් කුරුලු කූඩුවෙ හිටපු ගිනිකුරුල්ලයි දකින්න ලැබුණා. ඉවාන් කුමාරයා මරල ඒ ඔක්කෝම වස්තුව අර ගන්න ඔවුහු කල්පනා කළා. දිමිත්රි කුමාරයා තමන්ගෙ කඩුවෙන් ඉවාන් කුමාරයා කෑලි කෑලිවලට කපල දැම්මා. ඊට පස්සෙ සුන්දර රාජ කුමාරිකාව අවදි කළා.

''සුන්දර කුමාරියෙ, ඔබ කොයි රටේද, මොකක්ද ඔබේ නම?'' දිමිත්රි කුමාරයා ඇහුවා.

මරලා දාලා තිබුණ ඉවාන් කුමාරයා දැකල බය වුණු ඈ කඳුලු සලමින් කතා කළා.

''මම තමයි සුන්දර එලේනා රාජ කුමාරි. ඔබ ඉතාම දරුණු විදියට මරලා දැම්ම ඉවාන් කුමාරයා තමයි මා හොයා ගත්තෙ. එයත් එක්ක සටන් කරලා එයා පැරැද්දුව නම් තමයි ඔබලා නියම වීරයො වෙන්නෙ. ඒත් ඔබලා නිදාගෙන හිටිය කෙනෙකු තමයි මැරුවෙ.

මේ අහන්න සුන්දර එලේනා. ඔබ දැන් ඉන්නෙ අපේ අත් අඩංගුවෙ. අපි දැන් ඔබ අපේ තාත්තා ළඟට. ඒ කිව්වෙ විස්ලාව් රජ්ජුරුවො ළඟට එක්කල යනව. ඔබ එයාට කියන්න ඕනෑ. අපි තමයි ඔබයි. ගිනි කුරුල්ලයි රන්කේසර අස්සයයි හොයා ගත්තෙ කියල. එහෙම කිව්වෙ නැත්නම් ඔබත් මරනව.''

බියට පත් එලේනා ඒ විදියටම කියන්න පොරොන්දු වුණා. ඊට පස්සෙ කුමාරයො දෙන්නා සුන්දර එලේනා කුමාරිකාව හිමිවෙන්නේ කාටද, රන් කේසර අශ්වයා හිමි වෙන්නෙ කාටද කියල තීරණය කරන්න නොම්මර ඇද්දා. සුන්දර කුමාරිකාව වසීලි කුමාරයාට ලැබුණා. රන් කේසර අශ්වයා දිමිත්රී කුමාරයාට. වසීලි කුමාරයා තමන්ගෙ අශ්වයා පිට උඩ එලේනා කුමාරිකාව වාඩි කෙරෙව්වා. දිමිත්රී කුමාරයා රන්කේසර අශ්වයා පිටට නැගලා රජ්ජුරුවන්ට තෑගි දෙන්න ගිනිකුරුල්ලත් ගත්තා. ඊට පස්සෙ දෙන්නම තමන්ගෙ රට බලා පිටත් වුණා.

ඉවාන් කුමාරයාගෙ මළ සිරුර දින තිහක්ම පිට්ටනියෙ තිබුණා. දවසක් එතැනට ආව වෘකයාට ඒක හමුවුණා. වෘකයාට හිතුණා ඉවාන් කුමාරයාට පණ දෙන්න. ඌ දැක්කා පැටියාත් එක්ක හිටිය කපුටෙක්. ඌ එකපාරටම පඳුරට උඩින් පැනලා කපුටු පැටියා අල්ලා ගත්තා.

''මගේ දරු පැටියාට හිරිහැර කරන්න එපා.'' කපුටා කීවා.

''මේ අහපන් කපුටිච්චි, මං එයාට කිසිම හිරිහැරයක් කරන්නෙ නෑ. හැබැයි උඹ මට එක වැඩක් කරල දෙන්න ඕනෑ. උඹ තුන්නවවෙනි රට පහුකරල තුන්දහවෙනි රටට ඉගිලිලා ගිහින් ජීව ජලයයි මරණීය ජලයයි ගෙනත් දියන්.''

කපුටා කුප්පි දෙකකට වතුර ගෙනත් දුන්නා. එකක ජීව ජලය. අනෙක් කුප්පියේ මරණීය ජලය. වෘකයා කපුටු පැටියා කෑලිවලට කඩලා දමල මරණීය ජලය උගේ ඇඟට ඉස්සා. කපුටු පැටියාගෙ ඇඟේ ඊට පස්සෙ ජීව ජලය ඉස්සා. කපුටු පැටියාට පණ ආවා. වෘකයා වහාම මරණීය ජලය ඉවාන් කුමාරයාගෙ ඇඟට ඉස්සා. ඇඟේ කෑලි එකට එකතු වුණා. ඊට පස්සෙ ජීව ජලය ඉස්සා. ඉවාන් කුමාරයා නැගිටල සිට ගත්තා.

''අපොයි නින්ද ගිය තරමක්'' ඉවාන් කුමාරයා කීවා.

''ඔව්, මං ආවෙ නැත්නම් සදහටම නිදා ගන්න තිබුණා. ඔබේ සහෝදරයා ඔබ කෑලිවලට කපල දමල, සුන්දර එලේනා කුමාරිකාවයි. රන් කේසර අස්සයයි. ගිනිකුරුල්ලයි අරන් ගියා. ඉක්මන් කරන්න. අද වසීලි කුමාරයා ඔබේ සුන්දර එලේනා විවාහ කර ගන්නවා. මගේ පිටට නගින්න මං ඔබ අරන් යන්නම්.''

ඉවාන් කුමාරයා වෘකයාගෙ පිට උඩට නැග්ගා. වෘකයා විස්ලාව් රජ්ජුරුවන්ගෙ රාජධානියට දුවගෙන ගියා. ඉවාන් කුමාරයා මාලිගාවට යන කොට වසීලි කුමාරයා සුන්දර එලේනා කුමාරිකාව විවාහ කරගෙන ඇවිත් මගුල් මේසෙට වාඩිවෙලා. ඉවාන් කුමාරයා දැක්ක ගමන්ම සුන්දර එලේනා දුවගෙන ඇවිත් අඬ අඬා කතා කළා.



''මෙයා තමයි මං කැමති මනාලයා, ඉවාන් කුමාරයා, අර මේසෙට වාඩිවෙලා ඉන්න නපුර නෙවෙයි.''

රජ්ජුරුවො සුන්දර එලේනාගෙන් ප්‍රශ්න කළා. ඇය ඉවාන් කුමාරයා විසින් තමා ලබා ගත් සැටිත්, රන් කේසර අශ්වයයි. ගිනි කුරුල්ලයි දිනාගත් සැටිත්, වැඩිමල් සහෝදරයො නිදාගෙන සිටි ඉවාන් කුමාරයා මැරූ සැටිත් විස්තර කළා.

රජ්ජුරුවෝ දිමිත්රි කුමාරයයි. වසීලි කුමාරයයි හිර ගෙට දැම්මා. ඉවාන් කුමාරයා සුන්දර එලේනාව විවාහ කර ගත්තා. ඊට පස්සෙ දෙන්න බොහොම සතුටින් ජීවත් වුණා. එක මොහොතකටවත් වෙන් වුණේ නෑ.

නිමි

ගිනි කුරුල්ලා

රුසියන් බසින් පරිවර්තනය

එච්. ජයරත්න

ලෝකයේ ජනකතා සාහිත්‍යය ඉතා දියුණු වූවකි. ළමයින් තුළ සදාචාරාත්මක ගතිපැවතුම් ඇති කිරීමටත් සාධාරණ සමාජයක් ගොඩනැගීමේ ආකල්පය වඩාලිමටත් ඉන් ලැබෙන අනුබලය ඉතා විශාලය.

රුසියානු ජනකතා මේ අතරිනුදු සුවිශේෂ තැනක් ගනී. රුසියානු ජන සමාජය සදාචාර සම්පන්න සාධාරණ සමාජයක් බවට පත් කිරීමේ කාර්යයේදී මෙම ජනකතා ඉටුකොට ඇති කාර්යභාරය සමාජ විද්‍යාඥයන්ගේත් මානව විද්‍යාඥයන්ගේත් පැසසුමට ලක්ව තිබේ. දහස් ගණනක් එවැනි ජනකතා අතුරින් 'ගිනි කුරුල්ලා' කතාවටද හිමි වන්නේ වැදගත් තැනකි. මෙම කතාව රුසියානු ජාතික විතාලි ස්වාරෆ් සහ එලේනා අල්මාසවා විසින් චිත්‍ර සමඟ වඩාත් විචිත්‍ර ලෙස ළමයින් හමුවට ගෙන ඒම නිසා වර්තමාන ලෝකයේ දරුවන්ට ඉන් ලැබී ඇති ඵලය විශාලය.

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් උපාධි ලැබ රුසියාවේ ලුමුම්බා විශ්වවිද්‍යාලයෙහි අවුරුදු 07 කට වැඩි කාලයක් අධ්‍යයන කටයුතුවල නියැලෙමින් රුසියානු සාහිත්‍යකරුවන් ඇසුරු කළ එච්. ජයරත්න විසින් සිංහල දරුවන්ට එම කතාව දායාද කිරීමට ගෙන ඇති උත්සාහය ප්‍රශංසනීයය.

- සිරිසේන විතානගේ

සමීර පොතක්

සමීර ප්‍රකාශන
අංක 12, පොල්දූව, බත්තරමුල්ල.
දුර. : 0112 868249, 0716 058320
ඊ මේල් : menugraphics@gmail.com.

මිල රු. 380/-

ISBN - 978 - 955 - 0983 - 53 - 7

Designed by Jagath Deraniyagala - 077 5918785